සාධු සාධු භික්ඛවෙ යථා තෙ මහාසාවකා සම්මා බ්‍යාකරමානා බ්‍යාකරෙය්‍යුං. සද්දකණ්ටකා හි භික්ඛවෙ ඣානා වුත්තා මයා.

දසයිමෙ භික්ඛවෙ කණ්ටකා, කතමෙ දස: පවිවෙකාරාමස්ස සඞ්ගණිකාරාමතා කණ්ටකො, අසුභනිමිත්තානුයොගමනුයුත්තස්ස සුභනිමිත්තානුයොගො කණ්ටකො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරස්ස විසූකදස්සනං කණ්ටකො, බ්‍රහ්මචාරිස්ස[1] මාතුගාමොපචාරො[2] කණ්ටකො, පඨමස්ස ඣානස්ස සද්දො කණ්ටකො, දුතියස්ස ඣානස්ස විතක්කවිචාරා කණ්ටකො.[3] තතියස්ස ඣානස්ස පීති කණ්ටකො, චතුත්ථස්ස ඣානස්ස අස්සාසපස්සාසා[4] කණ්ටකො, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා සඤ්ඤා ච වෙදනා ච කණ්ටකො, රාගො කණ්ටකො, දොසො කණ්ටකො, මොහො කණ්ටකො. අකණ්ටකා භික්ඛවෙ විහරථ, නික්කණ්ටකා භික්ඛවෙ විහරථ. අකණ්ටකා භික්ඛවෙ අරහන්තො, නික්කණ්ටකා භික්ඛවෙ අරහන්තො. අකණ්ට නික්කණ්ටකා භික්ඛවෙ අරහන්තොති.

## 10. 2. 3. 3

## ඉට්ඨධම්ම සුත්තං

**[සාවත්ථි]**

දසයිමෙ භික්ඛවෙ ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, කතමෙ දස:

භොගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, වණ්ණො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, ආරොග්‍යං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, සීලං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, බ්‍රහ්මචරියං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, මිත්තා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, බාහුසච්චං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, පඤ්ඤා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, සග්ගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

---

1. බ්‍රහ්මචරියස්ස-මජ්ඣං.
2. මාතුගාමූපචාරො-මජ්ඣ.
3. කණ්ටකා-මජ්ඣං.

මහණෙනි, මැනැවැ, මැනැවැ යම් පරිදි ඒ මහසව්වෝ මොනොවට පවසන්නාහු කියත් නම් එසේ මවිසින් ධ්‍යානයෝ ශබ්දකණ්ටකයහයි කියන ලදහ.

මහණෙනි, මේ කණ්ටක දශයෙක, කවර දශයෙක යත්: ප්‍රවිවේකයෙහි ඇලුනහුට සඞ්ගණිකාරාමතාව කණ්ටක යි. අශුභනිමිත්තානුයොගයෙහි යෙදුනහුට ශුභනිමිත්තානුයොගය කණ්ටක යි. ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර ඇතියහුට විසුලුදස්න කණ්ටක යි, බ්‍රහ්මසරනුහට මාගමක වෙත හැසිරීම කණ්ටක යි. ප්‍රථමධ්‍යානයට ශබ්දය කණ්ටක යි. ද්විතියධ්‍යානයට විතර්ක-විචාර කණ්ටක යි. තෘතීයධ්‍යානයට ප්‍රීතිය කණ්ටක යි. චතුර්ථධ්‍යානයට ආශ්වාස ප්‍රශ්වාස කණ්ටක යි. සංඥාවෙදයිත නිරොධසමාපත්තියට සංඥාත් වෙදනාත් කණ්ටක යි. රාගය කණ්ටක යි, ද්වෙෂය කණ්ටක යි, මොහය කණ්ටක යි. මහණෙනි, කණ්ටක රහිත වූවාහු වාසය කරවු. මහණෙනි, නිෂ්කණ්ටකව වාසය කරවු. මහණෙනි, අකණ්ටක නිෂ්කණ්ටකව වාසය කරවු. මහණෙනි, රහත්හු අකණ්ටකයහ. මහණෙනි, රහත්හු නිෂ්කණ්-ටකයහ. මහණෙනි, රහත්හු අකණ්ටක නිෂ්කණ්ටකයහ යි.

## 10. 2. 3. 3
## ඉට්ඨධම්ම සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මේ ධර්ම දශදෙනෙක් ලොව්හි දුර්ලභයහ, කවර දශදෙනෙක යත්:

ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ භොගයෝ ලොව්හි දුර්ලභයහ. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ වර්ණය ලොව්හි දුර්ලභය. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ආරොග්‍යය ලොව්හි දුර්ලභය. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ශීලය ලොව්හි දුර්ලභය. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ බ්‍රහ්මචර්‍ය්‍යය ලොව්හි දුර්ලභය. ඉෂ්ට කාන්ත මනාප මිත්‍රයෝ ලොව්හි දුර්ලභයහ. ඉෂ්ට කාන්ත මනාප බාහුශ්‍රැත්‍යය ලොව්හි දුර්ලභය. ඉෂ්ට කාන්ත මනාප ප්‍රඥාව ලොව්හි දුර්ලභය. ඉෂ්ට කාන්ත මනාප ධර්මයෝ ලොව්හි දුර්ලභයහ. ඉෂ්ට කාන්ත මනාප ස්වර්ගයෝ ලොව්හි දුර්ලභයහ.

මහණෙනි, මෙ දසදහම්හු ඉෂ්ට කාන්ත මනාප වූවාහු ලොව්හි දුර්ලභයහ.





ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං, දසධම්මා පරිපන්ථා: ආලස්සං[1] අනුට්ඨානං භොගානං පරිපන්ථො, අමණ්ඩනා අභූසණා[2] වණ්ණස්ස පරිපන්ථො, අසප්පාය කිරියා ආරොග්‍යස්ස පරිපන්ථො, පාපමිත්තතා සීලානං පරිපන්ථො, ඉන්ද්‍රියාසංවරො බ්‍රහ්මචරියස්ස පරිපන්ථො, විසංවාදනා මිත්තානං පරිපන්ථො, අසජ්ඣාය කිරියා බාහුසච්චස්ස පරිපන්ථො, අසුස්සූසා අපරිපුච්ඡා පඤ්ඤාය පරිපන්ථො, අනනුයොගො අපච්චවෙක්ඛනා ධම්මානං පරිපන්ථො. මිච්ඡාපටිපත්ති සග්ගානං පරිපන්ථො.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ඉමෙ දස ධම්මා පරිපන්ථා.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං දසධම්මා ආහාරා අනාලස්සං උට්ඨානං භොගානං ආහාරො. මණ්ඩනාවිභූසනා වණ්ණස්ස ආහාරො. සප්පායකිරියා ආරොග්‍යස්ස ආහාරො. කල්‍යාණමිත්තතා සීලානං ආහාරො. ඉන්ද්‍රියසංවරො බ්‍රහ්මචරියස්ස ආහාරො, අවිසංවාදනා මිත්තානං ආහාරො. සජ්ඣායකිරියා බාහුසච්චස්ස ආහාරො. සුස්සූසා පරිපුච්ඡා පඤ්ඤාය ආහාරො, අනුයොගො පච්චවෙක්ඛනා ධම්මානං ආහාරො. සම්මාපටිපත්ති සග්ගානං ආහාරො.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ඉමෙ දසධම්මා ආහාරා ති.

## 10. 2. 3. 4

## වඩ්ඪී සුත්තං

**[සාවත්ථි]**

දසහි භික්ඛවෙ වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදයී ච හොති වරාදයී කායස්ස. කතමෙහි දසහි:

ඛෙත්තවත්ථූහි වඩ්ඪති. ධනධඤ්ඤෙන වඩ්ඪති. පුත්තදරෙහි වඩ්ඪති.

දාසකම්මකරපොරිසෙහි වඩ්ඪති. චතුප්පදෙහි වඩ්ඪති. සද්ධාය වඩ්ඪති. සීලෙන වඩ්ඪති. සුතෙන වඩ්ඪති. චාගෙන වඩ්ඪති. පඤ්ඤාය වඩ්ඪති. ඉමාහි ඛො භික්ඛවෙ දසහි වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති සාරාදායී ච හොති වරාදායී කායස්සා ති.

---

1. ආලස්‍යං – මජසං
2. අවිභූසණා – මජසං





මහණෙනි, ලොව්හි ඉෂ්ට, කාන්ත, මනාප, දුර්ලභ වූ මේ දශධර්මයනට උවදුරු දහම් දස දෙනෙකි: ආලස්‍යය හා අනුත්ථානය භොගයනට උවදුරෙක. අමණ්ඩනය හා අභූෂණය වර්ණයට උවදුරෙක. අසත්ප්‍රායක්‍රියාව ආරොග්‍යයට උවදුරෙක. පාපමිත්‍රතාව ශීලයනට උවදුරෙක. ඉන්ද්‍රිය අසංවරය බ්‍රහ්මචර්‍ය්‍යයට උවදුරෙක. විසංවාදනාව මිත්‍රයනට උවදුරෙක. අසධ්‍යාය-ක්‍රියාව බහුශ්‍රැත බවට උවදුරෙක. අශුශ්‍රෑෂාව හා අපරිපෘච්ඡාව ප්‍රඥාවට උවදුරෙක. අනනුයොගය හා අප්‍රත්‍යවෙක්ෂණාව ධර්මයනට උවදුරෙක. මිථ්‍යාප්‍රතිපත්තිය සවර්ගයනට උවදුරෙකි.

මහණෙනි, ලොව්හි ඉෂ්ට කාන්ත මනාප දුර්ලභ වූ මේ දශ ධර්මයන්ට මේ ධර්ම දශ ධර්මයෝ උවදුරු වෙත්.

මහණෙනි, ලොව්හි ඉෂ්ට කාන්ත මනාප දුර්ලභ වූ මේ දශධර්මයනට දශධර්ම කෙනෙක් ප්‍රත්‍යය වෙත්: අනාලස්‍යය හා උත්ථානය භොගයනට ප්‍රත්‍යය යි; මණ්ඩනා හා විභූෂණාව වර්ණයට ප්‍රත්‍යය යි. සත්ප්‍රායක්‍රියාව ආරොග්‍යයට ප්‍රත්‍යය යි, කල්‍යාණමිත්‍රතාව ශීලයනට ප්‍රත්‍යය යි, ඉන්ද්‍රිය-සංවරය බ්‍රහ්මචර්‍ය්‍යයට ප්‍රත්‍යය යි, අවිසංවාදනාව මිත්‍රයනට ප්‍රත්‍යය යි, සද්ධ්‍යායක්‍රියාව බාහුශ්‍රැත්‍යයට ප්‍රත්‍යය යි, සුශ්‍රෑෂාව හා පරිපෘච්ඡාව ප්‍රඥාවට ප්‍රත්‍යය යි, අනුයොගය හා ප්‍රත්‍යවෙක්ෂණාව ධර්මයනට ප්‍රත්‍යය යි, සම්‍යක් ප්‍රතිපත්තිය සවර්ගයනට ප්‍රත්‍යය යි.

මහණෙනි ලොව්හි ඉෂ්ට කාන්ත මනාප දුර්ලභ වූ මේ දශධර්මයනට මේ දශධර්මයෝ ප්‍රත්‍යයහ යි.

## 10. 2. 3. 4

## වඩ්ඪි සූත්‍රය

[සැවැත්]

මහණෙනි, වෘද්ධි දශයකින් වැඩෙන අරිසවු ආයර්‍ය්‍යවෘද්ධියෙන් වැඩෙයි. ශරීරයාගේ සාරය ගන්නා සල වෙයි. උත්තමාර්‍ය්‍යය ගන්නා

සුලුත් වෙයි. කවර දසයෙකින යත්:

ක්ෂෙත්‍රවාස්තුයෙන් වැඩෙයි. ධනධාන්‍යයෙන් වැඩෙයි. පුත්‍රදරයන්ගෙන් වැඩෙයි. දස් කම්කරු පුරුෂයන්ගෙන් වැඩෙයි. චතුෂ්පදීන්ගෙන් වැඩෙයි. ශ්‍රද්ධාවෙන් වැඩෙයි. ශීලයෙන් වැඩෙයි. ශ්‍රැතයෙන් වැඩෙයි. ත්‍යාගයෙන් වැඩෙයි. ප්‍රඥයෙන් වැඩෙ. මහණෙනි, මේ දශවෘද්ධියෙන් වැඩෙන අරිසවු ආයර්‍ය්‍යවෘද්ධියෙන් වැඩෙයි. ශරීරයාගේ සාරය ගන්නා සුලු වෙයි. උත්තමාර්‍ය්‍යය ගන්නා සුලුත් වෙයි.



බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාව
http://thripitakaya.org